# 61

වචනයේ දාසියයි මරිය මවේ
සම්මතය හැර දැමූ ළඳ ඔබයි
අසම්මත වූ දේව සැලසුම
වටහා ගත් අම්මා

අම්මා අම්මා ඔබයි අපේ අම්මා
ධනයට බලයට දාසියක් නොවී
හිස්වී සැමකින් දෙව් බවින් පිරී
අලුත් මැවිල්ලක් කැඩපතවූ
විශ්වයේ මව අම්මා
අම්මා අම්මා විශ්වයේ මව අම්මා

කැපවී වැයවී දෙව් කැමැත්ත සොයා
වචනය තෙමවූ සත්‍ය කුස දැරුවා
කඩු හතකින් හද සිදුරු කරන්නට
ඉඩ දුන් ළඳ අම්මා
අම්මා අම්මා ඉඩ දුන් ළඳ අම්මා

මරි මව් විලසින් සුදනුම් මග සොයමු
දෙව් කැමැත්තට සැම විට හිස නමමු
ඔබ ගිය මග අප මග වන දවසේ
අපිත් ඔබේ දරුවෝ
අම්මා අම්මා අපිත් ඔබේ දරුවෝ